# ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ
# ආරක්ෂිත ක්‍රීඩා ප්‍රතිපත්තිය

## 1. ප්‍රතිපත්ති ප්‍රකාශය

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව ("NOCSL") ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ගෞරවය සහ අභිමානය සුරකෙන, ආරක්ෂිත සහ සහයෝගී ක්‍රීඩා පරිසරයක් නිර්මාණය කිරීමට කැපවී සිටියි. ලිංගික අතවර සහ අපයෝජනය හේතුවෙන් පුද්ගලයාට සහ සංවිධානීය සෞඛ්‍යයට සිදුවන බාධාව හඳුනා ගැනීමට තම සාමාජිකයින් දිරිමත් කරමින්, 2007 වර්ෂයේ දී ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව විසින් ලිංගික අතවර සහ අපයෝජනය පිළිබඳ සම්මුති ප්‍රකාශය සම්මත කර ගන්නා ලදි. ඕනෑම ක්‍රීඩාවක් තුල ඕනෑම මට්ටමක දී ලිංගික අතවර හා අපයෝජන සිදුවිය හැකි අතර එය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කාර්ය සාධනය අඩුවීමට සහ ඔවුන් ක්‍රීඩා ක්ෂේත්‍රයෙන් ඉවත් වීමට ද හේතු වේ.

මේ අනුව, ජාතික ඔලිම්පික් කමිටුව පහත සඳහන් අරමුණු වලින් යුතුව ලිංගික අතවර සහ අපයෝජන වැළැක්වීම පිළිබඳ මෙම ආරක්ෂිත ක්‍රීඩා ප්‍රතිපත්තිය (**"ප්‍රතිපත්තිය"**) අනුගමනය කරයි.

- ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඇතිවිය හැකි ඕනෑම ආකාරයක ලිංගික අතවර සහ අපයෝජන හඳුනා ගැනීම සහ වැළැක්වීම
- ලිංගික අතවර සහ අපයෝජන සිද්ධීන්හි වින්දිතයින් යැයි කියනු ලබන තැනැත්තන් වෙනුවෙන් සහාය ලබා ගැනීම දිරිමත් කිරීම
- සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ මානසික, ශාරීරික සහ භාවමය සුභසාධනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම
- එවැනි ලිංගික අතවර සහ අපයෝජන සිද්ධීන් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු විනය ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කිරීම
- ලිංගික අතවර සහ අපයෝජන සිද්ධීන් විමර්ශනය කිරීම සහ අවශ්‍ය දඬුවම් පැනවීම සඳහා ස්වාධීන සහ විනිවිද භාවයෙන් යුත් විනය කමිටු පිහිටුවීම
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම පාර්ශවකරුවන් අතර ලිංගික අතවර සහ අපයෝජන පිළිබඳව අධ්‍යාපනය ලබාදීම සහ දැනුවත් භාවය ඉහළ නැංවීම

ජාතික ඔලිම්පික් කමිටුව ලිංගික අතවර හා අපයෝජන සම්බන්ධයෙන් කිසිදු ආකාරයක ලිහිල් භාවයක් නොදක්වන අතර, ලිංගික අතවර හා අපයෝජන පිළිබඳ පැමිණිල්ලක් / චෝදනාවක් ඉදිරිපත් වූ විට, අදාළ විමර්ශන කමිටුවට විනය, දණ්ඩන හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ග නියම කිරීමට අදාළ විමර්ශන කමිටුවට අවස්ථාව සලසමින් සහ කමිටුව බලගන්වමින් අපක්ෂපාතී සහ සාධාරණ ලෙස ක්‍රියාත්මක වීම පරිපාලකයින්, පුහුණුකරුවන්, දෙමාපියන්, තරඟ සංවිධායකයින් සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇතුළු සෑම පාර්ශවකරුවකුගේ ම යුතුකම වේ.

## 2. ආරක්ෂිත ක්‍රීඩා ප්‍රතිපත්තියේ භාවිතය

අධ්‍යක්ෂවරුට, සේවකයින්ට. පරිපාලන නිලධාරීට, පුහුණුකරුවට, තරඟ නිලධාරීට, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට, ස්වේච්ඡා සේවකයින්ට, සීමාවාසිකයින්ට සහ පහත සඳහන් සංවිධානයන්හි විෂයපථයන් යටතට ගැනෙන අනෙකුත් සියලුම පාර්ශවකරුවන්ට මෙම ප්‍රතිපත්තිය අදාළ වේ.

(අ) ඔලිම්පික් ක්‍රීඩා වැඩසටහනට ඇතුළත් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් පාලනය මෙහෙයවනු ලබන ජාත්‍යන්තර සම්මේලනයකට අනුබද්ධ ජාතික ක්‍රීඩා සම්මේලනයක්; හෝ

(ආ) වරින් වර ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවෙහි විෂය පථය යටතේ හඳුනාගන්නා ලද සහ පිළිගන්නා ලද බහු ක්‍රීඩා (එනම් ආසියානු ක්‍රීඩා, පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සහ දකුණු ආසියානු ක්‍රීඩා සහ ඔලිම්පික් හැර වෙනත් ඕනෑම ක්‍රීඩා)

**3. ගැටළුව අර්ථදැක්වීම**

සම-ක්‍රීඩක ක්‍රීඩිකාවන් ද වරදකරුවන් ලෙස හඳුනාගත හැකි වුව ද, ක්‍රීඩා ක්ෂේත්‍රය තුල ලිංගික අතවර හා අපයෝජන පැන නැගීම බල සම්බන්ධතා සහ ප්‍රධාන වශයෙන් අධිකාරිය සහිත සිටින පුද්ගලයකු විසින් සිදුකරන බලය අයුතු ලෙස භාවිතාකිරීම තුළින් සිදුවේ. මෙහිදී ලිංගික අතවර හා ලිංගික අපයෝජන අතර වෙනස සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

(අ) **ලිංගික අතවර** යනු පුද්ගලයෙකුට හෝ සමූහයෙකුට එරෙහිව සිදුකරන බලය සහ විශ්වාසය අනිසි ලෙස භාවිතා කිරීම මත පදනම් වූ අපේක්ෂිත හෝ අනපේක්ෂිත, නීතිමය හෝ නීති විරෝධී ලිංගික ස්වභාවයගත් වාචික, වාචික නොවන හෝ කායික හැසිරීමකි. ලිංගික අතවර යන්න අනෙකාගේ අකමැත්තෙන් හෝ බලහත්කාරයෙන් සිදුකරන ලද්දක් බවට වින්දිතයා හෝ පසෙක බලාසිටි තැනැත්තකු විසින් සලකනු ලැබේ.

(ආ) **ලිංගික අපයෝජනය** යන්නට කැමැත්ත ලබා නොදෙන හෝ ලබා දිය නොහැකි ඕනෑම ලිංගික ක්‍රියාකාරකමක් ඇතුළත් වේ. එයට බොහෝ විට ක්‍රීඩාවේදී ක්‍රීඩකයා හසුරුවා ගැනීම සහ උගුලට හසු කර ගැනීම ඇතුළත් වේ.

ලිංගික අතවර සහ අපයෝජන සිදුවන්නේ එවැනි අවස්ථාවන්ට පහසුව සලසන ආයතනික සංස්කෘතියක් තුළ ය. ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ අතවර, නවක හිංසනය සහ සමලිංගික භීතිකාව යන සියල්ලම ක්‍රීඩාව තුල ලිංගික අතවර සහ අපයෝජනයේ ආකාර වේ.

(අ) **ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ අතවර** යනු ක්‍රමානුකූලව සහ නැවත නැවත සිදු කරනු ලබන එසේ වුවද අවශ්‍යයෙන් ම ලිංගික ස්වභාවයේ වියයුතු නොවන ආකාරයේ කවර හෝ ලිංගික පාර්ශවයකට අවමන් සහගත ලෙස සැලකීමකි.

(ආ) **නවක හිංසනය** යනු බොහෝ විට ලිංගික සංරචක අඩංගු සහ නවකයින් ඉලක්ක කරගත් අපයෝජනාත්මක ආරම්භක චාරිත්‍ර වේ.

(ඇ) **සමලිංගික භීතිකාව** යනු නිහඬ ප්‍රතිරෝධයකින් ඇරැඹී සක්‍රීයව ගොදුරු කර ගැනීම දක්වා විහිදෙන සමලිංගික, පුරුෂ සමලිංගික, ද්විලිංගික සහ සංක්‍රාන්තික ලිංගික පුද්ගලයින් අගතියට පත්කිරීම සහ වෙනස්කොට සැලකීමේ ආකාරයකි.

ආරක්ෂාව අඩුවීම, වරද සිදුකරන්නා ගේ ඉහළ අභිප්‍රේරණය සහ ක්‍රීඩකයා වයසින් හා මනසින් පරිණත නොවීම හේතුවෙන් ඇතිවන අනාරක්ෂිත බව යන කරුණු යෙදී ඇතිවිට ලිංගික අතවර අවදානම බෙහෙවින් වැඩි වේ. ලිංගික අතවර සහ අපයෝජනයට පහත සඳහන් ක්‍රියාවන් ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

**කායික**

- අයුතු කායික ස්පර්ශ කිරීම්
- අනවශ්‍ය පරිදි සමීපව සිටීම
- ස්පර්ශ කිරීම, තට්ටු කිරීම, පහර දීම, මිරිකීම, වැළඳ ගැනීම, කෙනිත්තීම
- කෙනෙකුගේ ලිංගේන්ද්‍රිය යමෙකුට ඒරෙහිව ඇතිල්ලීම හෝ පිරිමැදීම
- ලිංගික අඩන්තේට්ටම්

**වාචික**

- ලිංගික අදහස් දැක්වීම හෝ ඉඟි කිරීම
- පුද්ගලයෙකුගේ ලිංගිකත්වයට හෝ ලිංගික අනන්‍යතාවයට අපහාස කිරීම
- පුද්ගලයෙකුගේ ශාරීරික පෙනුම, වයස, පෞද්ගලික ජීවිතය, තනිකඩ හෝ විවාහක තත්ත්වය, මාතෘ හෝ මාතෘ නොවන තත්ත්වය පිළිබඳව අදහස් දැක්වීම
- ලිංගික විහිළු හෝ කතා විස්තර කිරීම හෝ ලිංගික මනඃකල්පිතයන් පිළිබඳව විමසීම
- වෘත්තීය සාකච්ඡා වලට ලිංගික මාතෘකා අදාළ කරගැනීම
- ලිංගික අනුග්‍රහය ඉල්ලා සිටීම
- ක්‍රීඩා ජීවිතයේ දියුණුව ඇතිකිරීම වෙනුවෙන් ලිංගික අනුග්‍රහය ඉල්ලා සිටීම (*quid pro quo*)
- උරුවම්බෑම හෝ ලිංගික යෝජනා ගම්‍යකරන ශබ්ද ඇතිකිරීම
- අසභ්‍ය සහ අපහාසාත්මක භාෂාව භාවිතා කිරීම
- නිර්නාමික දුරකථන ඇමතුම් ලබාදීම
- නැවත නැවතත් පිළිගත නොහැකි සමාජ ආරාධනා සිදුකිරීම
- ඕපාදූප කීම, අපහාස කිරීම හෝ කටකතා පතුරුවා හැරීම

**අභිනය**

- නිරතුරුවම අඩවන්ව බැලීම, නෙතඟින් බැලීම, ඇස් ගැසීම, පරීක්ෂාවෙන් සිටීම
- චුම්බන සුළඟේ පාකර එවීමේ ඉරියව්, දිව සෙලවීම හෝ තොල් ලෙවකෑම
- ලිංගික අදහස් දක්වන අත් හෝ ඇඟිලි චලනයන් සිදු කිරීම
- ලිංගික අදහස් පලකරන ක්‍රියාවන් අනුකරණය කිරීම

**දෘශ්‍ය**

- අනවශ්‍ය විද්‍යුත් තැපැල් පණිවිඩ, කෙටි පණිවිඩ යැවීම හෝ ලිංගික අදහස් පලකරන විහිළු පළකිරීම
- සමාජ මාධ්‍ය වේදිකා (එනම්: ෆේස්බුක්, ට්විටර්, වට්ස්ඇප්, වයිබර්, මැසෙන්ජර්, ස්නැප්චැට්, ඉන්ස්ටග්‍රෑම් ආදිය) හරහා ලිංගික අදහස් දැක්වීම සහ අයථා ප්‍රෙව්ශයන් ගැනීම
- ලිංගික අර්ථ සහිත ලිපි ලිවීම හෝ සිතුවම් ඇඳීම
- ලිංගික අදහස් දක්වන පින්තූර, ඡායාරූප, පෝස්ටර්, දින දර්ශන, ඩෙස්ක්ටොප් බිතුපත් හෝ අසභ්‍ය වෙබ් අඩවි ප්‍රදර්ශනය කිරීම
- වෙනත් පුද්ගලයෙකුගේ සමීප පින්තූර / වීඩියෝ, ඔවුන්ගේ අනුදැනුමකින් / කැමැත්තකින් තොරව ඕනෑම මාර්ගගත හෝ මාර්ගගත නොවන වේදිකාවක පළ කිරීම හෝ බෙදා ගැනීම

ආරක්ෂිත ක්‍රීඩා ප්‍රතිපත්තියේ අරමුණු සම්බන්ධයෙන්, ලිංගික අතවර සහ/හෝ අපයෝජනය යන්න පහත සඳහන් ස්ථානවල සිදුවිය හැකි නමුත්, ඒවාට පමණක් සීමා නොවේ.

(අ) ක්‍රීඩා ඉසව්, ක්‍රීඩාංගණ, තරඟ ස්ථාන සහ පුහුණු සැසිවලදී;

(ආ) ලියාපදිංචි හෝ ලියාපදිංචි නොකළ සම්මේලන කාර්යාල සහ/හෝ ක්‍රීඩාවලට අදාළ වෙනත් කාර්යාලවලදී;

(ඇ) ක්‍රීඩා ආශ්‍රිත සමාජයීය උත්සවවලදී;

ඈ) අදාළ ජාතික ක්‍රීඩා සංගමයේ/ සම්මේලනයේ සහ රැස්වීම්, සම්මන්ත්‍රණ, පුහුණු සැසි සහ වැඩමුළු වැනි එහි සාමාජික සමාජවල ව්‍යාපාරික කටයුතුවලදී;

(ඉ) ක්‍රීඩා ආශ්‍රිත ගමන් අතරතුර;

(ඊ) දුරකථන, ජංගම දුරකථන, සමාජ මාධ්‍ය, විද්‍යුත් තැපැල, ෆැක්ස්, වෙබ් අඩවි, තැපැල් සේවය ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවන ඕනෑම ආකාරයක සන්නිවේදන උපාංගයක්/පද්ධතියක් හරහා;

(උ) ක්‍රීඩාව සමග පවතින සම්බන්ධය හේතුකොට ගෙන ඇතිවන ප්‍රතිපලයක් ලෙස පුද්ගලයෙකුට ලිංගික අතවර සහ/හෝ අපයෝජනය සිදුවන ඕනෑම විධිමත් හෝ අවිධිමත් ස්ථානයක්

## 4. ඒකඟතාවයෙන් සහ ස්වකැමැත්තෙන් ඇතිකරගන්නා සම්බන්ධතා

### 4.1. පුහුණුකරු සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතර සබඳතා

සාමාන්‍යයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කරන විට, ඇගයීමට ලක් කරන විට, විවේචනය කරන විට හෝ ප්‍රශංසා කරන විට පුහුණුකරු විසින් ඔවුන් කෙරෙහි ක්‍රියාත්මක කරන බලය පදනම් කොටගෙන පුහුණුකරුවෙකු සහ ක්‍රීඩකයකු අතර සම්බන්ධතාවය ඇති වේ. පුහුණුකරු විසින් බලය අනිසි ලෙස භාවිතා කිරීමේ අත්‍යාසන්න අවදානම සහ ක්‍රීඩකයා ලිංගිකව සූරාකෑමට ලක්වීමේ අවදානම හේතුවෙන්, මෙම දෙපාර්ශවය අතර ලිංගික සම්බන්ධතාවයක් (ස්වකැමැත්තෙන් වුවද) ඇතිවීම සුදුසු නොවේ. මූලික වශයෙන් සම්බන්ධතාවයේ අසමතුලිත ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී, ක්‍රීඩකයාගේ ස්වේච්ඡා කැමැත්ත ද විවාදාත්මක වන අතර එය මතභේදයට තුඩු දෙන කරුණකි. තවද, එවැනි සබඳතා මගින් සම්මුති ඝට්ටනයක් ඇති කළ හැකි අතර එමඟින් පුහුණුකරුවෙකුගේ විචාර ශක්තිය හීන වනු ඇත. එවැනි වෘත්තීය නොවන හැසිරීමක් අනෙකුත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ද අහිතකර විය හැකි අතර එවැනි සම්බන්ධතාවයක් හෝ ලිංගික අනුග්‍රහයන් ලෙස සැලකෙන දෑ හේතුවෙන් ව්‍යංග්‍යාකාරව ප්‍රතිලාභ හෝ අනවශ්‍ය වාසියක් ලබා ගැනීමක් ගම්‍යවන මතයක් නිර්මාණය විය හැකිය.

ඒ අනුව, පුහුණුකරුවන්ගේ වෘත්තීය අඛණ්ඩතාව සහ ක්‍රීඩකයින්ගේ අධ්‍යාපනික මෙහෙවර අවදානමට ලක් කරන බැවින්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් (ඔවුන් විසින් පුහුණුව ලබා දෙනු ලබන හෝ ඔවුන්ගේ පාලනය යටතේ සිටින) සමඟ ඒකඟතාවයෙන් සහ ස්වකැමැත්තෙන් ඇතිකරගන්නා සම්බන්ධතා නොපැවැත්වීමට පුහුණුකරුවන්ට නියෝග කිරීම වැදගත් වේ. මෙම අරමුණ උදෙසා, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් එවැනි සබඳතා ප්‍රතික්ෂේප කිරීම සඳහා එවැනි සම්බන්ධතා තහනම් කිරීම පිළිබඳ වගන්තියක් ද ක්‍රීඩකයා සමඟ වූ පූර්ව ඒකඟතාවයෙන් සහ ස්වකැමැත්තෙන් ඇතිකරගන්නා සම්බන්ධතා/ආදර සබඳතාවක්, එම සම්බන්ධතාවයේ කාලසීමාව සහ එම සම්බන්ධතාවයේ වත්මන් තත්ත්වය අනාවරණය කිරීම සඳහා තොරතුරු අනාවරය කිරීම පිළිබඳ වගන්තියක් ද ඇතුළත් කර ඇත.

### 4.2. සම-ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතර සබඳතා

මෙවැනි ආකාරයේ සබඳතා තහනම් කර නොතිබුණද, එවැනි සබඳතා පරිපාලන බලධාරීන්ට අනාවරණය කිරීමට ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිරිමත් කරනු ලැබේ. දෙපාර්ශවයේ නම්, සම්බන්ධතාවයේ ස්වභාවය, සම්බන්ධතාවයේ කාලසීමාව සහ වෙනත් අදාළ තොරතුරු මෙවැනි අනාවරණ තුල අන්තර්ගත විය යුතුය.

## 4.3. පුහුණු නිලධාරීන්, පරිපාලකයින් සහ වෙනත් ඕනෑම අයෙකු අතර සබඳතා

ඕනෑම ආකාරයක සම්මුති සම්බන්ධතාවයන් සම්බන්ධයෙන් පරිපාලන බලධාරීන් වෙත කරුණු අනාවරණය කිරීමට පුහුණුකරුවන්, පරිපාලකයින් සහ වෙනත් ඕනෑම අයෙකු දිරිමත් කරනු ලැබේ. අනාවරණය තුල දෙපාර්ශවයේ නම්, සම්බන්ධතාවයේ ස්වභාවය, සම්බන්ධතාවයේ කාලසීමාව සහ වෙනත් අදාළ තොරතුරු අන්තර්ගත විය යුතුය. . අදාළ කමිටුවලින් ස්වේච්ඡාවෙන් ඉවත් වීමට ද ඔවුන් දිරිමත් කරනු ලැබේ.

## 5. සහන සැලසීම

මෙම වගන්තිය මගින් පැමිණිලක් ඉදිරිපත් කල හැක්කේ කා විසින්ද, කා වෙත ද, සහ පැමිණිල්ලක අන්තර්ගත විය යුත්තේ කවර කරුණු ද යන්න පිළිබඳ තොරතුරු සපයයි.

## 5.1 පැමිණිලි ඉදිරිපත් කළ හැක්කේ කා විසින් ද?


තමන් ලිංගික අතවරකට හෝ අපයෝජනයකට ලක්ව ඇති බව විශ්වාස කරනු ලබන සේවකයෙකු, පරිපාලන නිලධාරියෙකු, පුහුණුකරුවෙකු, තරඟ නිලධාරියෙකු, ක්‍රීඩකයෙකු, ස්වේච්ඡා සේවකයෙකු හෝ සීමාවාසිකයෙකු සහ ඉහත 2 වන වගන්තියේ ("වින්දිතයා") විෂය පථයට අයත් හෝ පහත ලැයිස්තුගත කර ඇති ඕනෑම තැනැත්තෙකු විසින් ("පැමිණිලි කරන්නා"), පහත 5.2 වගන්තියේ දක්වා ඇති පරිදි එවැනි ලිංගික අතවර සහ/හෝ අපයෝජනයක් පිළිබඳව දැනුවත් වූ වහාම පැමිණිලි කමිටුව වෙත ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබිය හැකියි:

| කායික වශයෙන් අසමත් වින්දිතයකු වෙනුවෙන් | මානසික වශයෙන් අසමත් වින්දිතයකු වෙනුවෙන් |
|---|---|
| වින්දිතයාගේ ඥාතියකු/මිත්‍රයකු<br>සම-ක්‍රීඩකයකු<br>ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ පරිපාලන නිළධාරී<br>සිදුවීම පිළිබඳ දැනුවත් ඕනෑම පුද්ගලයකු වින්දිතයාගේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව | වින්දිතයාගේ ඥාතියකු/මිත්‍රයකු<br>සුදුසුකම් ලත් මනෝ චිකිත්සකයකු/මනෝ විද්‍යාඥයකු<br>වින්දිත තැනැත්තාට ප්‍රතිකාර ලබාදීම පිළිබඳ අධිකාරිය සහිත නිළධාරියා<br>ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ පරිපාලන නිළධාරී |

කුමන තත්වයක් යටතේ හෝ වින්දිතයා මියගොස් ඇත්නම්, එවැනි සිදුවීමක් පිළිබඳව දන්නා ඕනෑම පුද්ගලයෙකුට වින්දිතයාගේ පවුලේ සාමාජිකයින්ගේ කැමැත්ත ඇතිව පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.

ජාතික ඔලිම්පික් කමිටුව විසින් අසත්භාවයෙන් ඉදිරිපත් කරනු ලබන හෝ නිරර්ථක සහ නොමඟ යවන සුළු පැමිණිලි භාර ගනු නොලබන අතර එවැනි පැමිණිලි කරන ඕනෑම පුද්ගලයෙකුට එරෙහිව පියවර ගනු ලැබේ.

## 5.1. පැමිණිල්ලේ අඩංගු විය යුත්තේ කවර කරුණු ද?




## 5.2. පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුත්තේ කවුරුන් වෙත ද?

ලිංගික අතවර සහ අපයෝජන පිළිබඳ පැමිණිලි, අවම වශයෙන් සියයට පනහකවත් (50%) කාන්තා නියෝජනයක් සහිත පැමිණිලි කමිටුවක් ("CC") විසින් භාර ගනු ලබන ලැබිය යුතුවේ. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් පත් කරන ලද පැමිණිළි කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය:

| අංකය | සාමාජිකයා | සුදුසුකම් |
|---|---|---|
| 1 | හිටපු කීර්තිමත් ක්‍රීඩිකාවක් | ජාත්‍යන්තර තරගාවලියකට ශ්‍රී ලංකාව නියෝජනය කරන ගද හිටපු ජෝෂ්ඨ ක්‍රීඩිකාවක් |
| 2 | නීති නිලධාරීන් දෙදෙනෙක් | ලිංගික අතවර සහ අපයෝජනයට අදාළ ක්‍රියාවන්, ප්‍රතිපත්ති සහ වෙනත් පනත් පිළිබඳව ගැඹුරු දැනුමක් ඇති සහ ලිංගික අතවර සහ අපයෝජන වැළැක්වීමට කැපවී සිටින අය |
| 3 | ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ කාන්තා කමිටුවේ සාමාජිකාවක් | සම්මුති සට්ටනයක් නොමැති බවට පෙනි යන ජාතික ඔලිම්පික් කාන්තා කමිටුවේ කාන්තා සාමාජිකාවක් |

## 5.4 පැමිණිලි ක්‍රියාපටිපාටිය

**පැමිණිලි කමිටුව**

**අ. පැමිණිල්ල භාර ගැනීම**

- පැමිණිල්ල භාර ගැනීම සහ භාරගත් බව දැන්වීම
- පැමිණිලිකරුට ඔහුගේ/ඇයගේ දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමට බියෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම සඳහා ඔහු කෙරෙහි සංවේදී ආකල්පයක් දැක්වීම
- ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය තුළ විධිමත් සහ අවිධිමත් යාන්ත්‍රණ සඳහා විකල්ප ගවේෂණය කිරීම (මින් ඉදිරියට අර්ථ දක්වා ඇත)
- පැමිණිල්ල පිළිබඳව චූදිත පාර්ශවයට දැනුම් දීම

**ආ. සම්මුඛ පරීක්ෂණ**

- පැමිණිලිකරු, චූදිත පාර්ශවය සහ සාක්ෂිකරුවන් (ඇත්නම්) වෙන වෙනම සම්මුඛ පරීක්ෂණයට ලක්කිරීම

**විමර්ශන කමිටුව**

**ඇ. විමර්ශනය**

- පැමිණිලිකරුට සහ චූදිත පාර්ශවයට සිද්ධිය පිළිබඳ ඔවුන්ගේ අනුවාදයන් ඉදිරිපත් කිරීමට සාධාරණ අවස්ථාවක් ලබා දීම
- ප්‍රධාන සාක්ෂිකරුවන් පරීක්ෂාවට ලක්කිරීම
- බාල වයස්කාර පැමිණිලිකරුවන් ............

**ඇ. විශ්ලේෂණය කිරීම**

- පරීක්ෂණයේදී රැස්කරගත් තොරතුරු අදාළ නීතිය උපයෝගී කර ගනිමින් විවේචනාත්මකව විශ්ලේෂණය කර ඇගයීම
- සිදුවීම් අනුපිළිවෙල තහවුරු කිරීම සඳහා කාලරාමුවක් සකස් කිරීම
- පැමිණිල්ලකරු, චූදිත පාර්ශවය සහ සාක්ෂිකරුවන් විසින් කරන ලද ප්‍රකාශයන්හි සමානකම් සහ වෙනස්කම් සාපේක්ෂව සැසඳීම

**ඇ. අනාවරණයන් සහ නිර්දේශ**

- අනාවරණය කරගැනීම් මත පදනම් වූ නිර්දේශ
- විමර්ශණ කමිටුවේ තීරණය අඩංගු සවිස්තර වාර්තාවක් සකස් කිරීම

**(අ) පැමිණිල්ල භාර ගැනීම**

පැමිණිලි කමිටුව විසින් පැමිණිලි භාර ගැනීම සහ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීම ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ ලිංගික අතවර සහ අපයෝජන ප්‍රතිපත්ති ක්‍රියාත්මක විමේ ක්‍රමවේදයට (“WM”) අනුකූල විය යුතු අතර බැලූ බැල්මට පහත සඳහන් කරුණු පිළිබඳව සෑහීමකට පත්වන්නේ නම් පමණක් පැමිණිලි කමිටුව විසින් පැමිණිල්ල ඉදිරියට පවත්වාගෙන යනු ලැබේ.

- චූදිත පාර්ශවය විසින් ලිංගික අතවරයක් සහ/හෝ අපයෝජනයක් විය හැකි නුසුදුසු සහ/හෝ අහිතකර හැසිරීමක් පෙන්නුම් කිරීම;
- හැසිරීම පැමිණිලිකරු වෙත යොමු කිරීම;
- පැමිණිලිකරු හානියක් හෝ හානියක් සිදුවිය හැකි බවක් අත්විඳීම

චූදිත පාර්ශවය සහ පැමිණිලිකරු පැමිණිලි කමිටුව හමුවීමට පැමිණීම සඳහා යොමුකළ යුතු අතර පැමිණිල්ලේ බරපතලකම මත පදනම්ව, පැමිණිලි කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි සහන ලබාදීම සම්බන්ධයෙන් විධිමත් සහ අවිධිමත් යාන්ත්‍රණ විකල්පයන් පිළිබඳ සොයා බැලීම සඳහා ද යොමු කළ යුතු වේ.

- **අවිධිමත් යාන්ත්‍රණ**

පිළිගත නොහැකි හැසිරීම වහාම නැවැත්වීමට චූදිත පාර්ශ්වයට උපදෙස් දීම හෝ අවවාද කිරීම හෝ පාර්ශව අතර ආරවුල විසඳීම සඳහා සමථකරුවෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා මධ්‍යස්ථ පුද්ගලයෙකු පත් කිරීම (එවැනි සමථකරුවෙක් ඔහුගේ/ඇයගේ නිර්දේශය පැමිණිලි කමිටුවවෙත ඉදිරිපත් කරයි) මෙයට ඇතුළත් වේ. කෙසේ වෙතත්, පැමිණිලි කමිටුව සෑම විටම පැමිණිල්ලේ බරපතළකම පිළිබඳ සලකා බැලිය යුතු අතර, චූදිත පාර්ශ්වය සමඟ සෘජුවම ගැටලුව විසඳා ගැනීම සඳහා පැමිණිලිකරුට උපදෙස් දීමෙන් වැළකී සිටිය යුතුය.

- විධිමත් යාන්ත්‍රණ

පැමිණිලිකරු විසින් තීරණය කරන්නේ නම් හෝ සමථකරු විසින් යෝජනා කරන්නේ නම් හෝ පැමිණිල්ලේ බරපතල ස්වභාවය විසින් විධිමත් පිළියමක් ඉල්ලා සිටින්නේ නම්, පැමිණිලි කමිටුව විසින් ඉහත දක්වා ඇති ක්‍රියාවලිය අනුගමනය කරනු ලැබේ. එපමණක් නොව, කිසිදු ආකාරයක සම්මුති සට්ටනයක් නොමැති බවට පැමිණිලි කමිටු සාමාජිකයින් විසින් සහතික විය යුතුය. ඉන්පසුව, පැමිණිල්ල ලැබී දින 14ක් ඇතුළත පැමිණිලි කමිටුව විසින් චූදිත පාර්ශ්වයට ඒ බව දැනුම් දිය යුතු අතර, එම පැමිණිල්ලට දින 30ක් ඇතුළත ලිඛිතව පිළිතුරක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් චූදිත පාර්ශවය වෙත ලබා දිය යුතුය. අනතුරුව, පැමිණිලි කමිටුව විසින් අදාළ සියලුම නීති, ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සමග පැමිණිල්ල සහ චූදිත පාර්ශ්වයේ පිළිතුර (ඇත්නම්), සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුව, සම්මුඛ පරීක්ෂණ සැලැස්ම ඇතුළු අදාළ අනුලේඛන සඳහා වෙනම රහස්‍ය ගොනුවක් නිර්මාණය කළ යුතු වේ. පැමිණිල්ලේ තත්ත්වය පිළිබඳ නිරන්තර යාවත්කාලීන කිරීම් පැමිණිලිකරු වෙත සපයනු ලැබේ.

**(ආ) සම්මුඛ පරීක්ෂණ**

සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන්නන් බිය ගැන්වීමක් නොවන බවට වග බලා ගැනීම සඳහා, එක් එක් පුද්ගලයාගේ සම්මුඛ සාකච්ඡා වෙන වෙනම සහ රහසිගතව පැවැත්විය යුතුය. ක්‍රියාවලියේ රහස්‍යභාවය සහතික කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ රහස්‍ය පරිසරයක පැවැත්විය යුතුය. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේදී පහත සඳහන් මාර්ගෝපදේශ අනුගමනය පිළිපැදිය යුතුය.

අ. කරුණුවල විවිධ අනුවාද අවබෝධ කරගන්නා අතරතුර සංවේදී වන්න.

ආ. සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලිය සහ විෂයයේ සංවේදීතාව පැහැදිලි කරන්න.

ඇ. පරීක්ෂාවට ලක්වන කරුණ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකි වන පරිදි සුදුසු ප්‍රශ්න අසන්න.
ඈ සුදුසු ස්ථානයක් තෝරාගන්න.
ඉ. ලිඛිත සටහන් සහ හඬ පටිගත කිරීම් හරහා සම්මුඛ පරීක්ෂණය වාර්තාගත කරන්න.
ඊ. ප්‍රකාශයන් සඳහා අත්සන් ලබාගන්න.

**(ඇ) විමර්ශනය**

සාමාජිකයින් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක (50% ට වඩා වැඩි) ප්‍රමාණයක් කාන්තාවන් විය යුතු පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විමර්ශණ කමිටුවක් ("HC") ඉදිරියේ පරීක්ෂණය සිදු කරනු ලැබේ.

i. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ සභාපති හෝ මහ ලේකම් (නිල වශයෙන්)
ii. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ කාන්තා කමිටුවේ සභාපතිනිය
iii. ක්‍රීඩා අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු හෝ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිසි පරිදි බලය පවරන ලද ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරියෙකු
iv. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් නම් කරන ලද නීතිඥයෙක්
v. චූදිත පක්ෂය සම්බන්ධ වන ක්‍රීඩාවේ ජාතික සම්මේලනයට තේරී පත් වූ නියෝජිතයෙක්
vi. ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ ලිංගික හිංසන පැමිණිලි කමිටුවේ නියෝජිතයන් දෙදෙනෙක්

මෙම පරීක්ෂණය ස්වභාවයෙන්ම විමර්ශනාත්මක විය යුතු අතර, එහිදී පැමිණිලිකරුට සහ චූදිත පාර්ශවයට සාධාරණ විභාගයක් ලබා දිය යුතු මෙන්ම, දෙපාර්ශවයටම ඔවුන්ගේ පරීක්ෂනයට සහාය දැක්වීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට සහ සාක්ෂිකරුවන් වෙතින් සහ පාර්ශවයන්ට එරෙහිව ඉදිරිපත් කරන ලද සාක්ෂි පිළිබඳ හරස් ප්‍රශ්න ඇසීමට සමාන අවස්ථාවක් ලබා දිය යුතුය. කාරණයේ සංකීර්ණත්වය හෝ එහි වාර්තාවේ ප්‍රකාශිතව දක්වා ඇති සුවිශේෂී තත්ත්වයන් විසින් දීර්ඝ කාලයක් අවශ්‍ය බවට දක්වා නොමැති නම් විමර්ශණ කමිටුව ඉදිරියේ ඇති පරීක්ෂණය ලිඛිතව සහ හඬ පටිගත කිරීම් මගින් වාර්තාගත කර දින 21ක් ඇතුළත අවසන් කළ යුතුය.

එවැනි පරීක්ෂණ ක්‍රියාවලියක් පැවැත්වීමේ දී විමර්ශණ කමිටුව විසින් පිළිපැදිය යුතු ස්වභාවික යුක්තියේ නීතිරීතිවලට සීමා නොවී, චූදිත පාර්ශ්වයකට පහත අයිතිවාසිකම් ද හිමිවිය යුතුය.

අ. විමර්ශණ කමිටුවේ අනාවරණය කරගැනීම් සහ නිර්දේශ ඇතුළුව විමර්ශන ක්‍රියාවලියේ කොටසක් වන සියලුම ලේඛනවල පිටපත්;
ආ. එවැනි පරීක්ෂණයකදී නියොජිතයකු යෙදවීම;
ඇ. විමර්ශන කටයුතු අතරතුර නිරීක්ෂකයෙකු යෙදවීම.

**(ඈ) විශ්ලේෂණය කිරීම**

විමර්ශනයෙන් පසු විමර්ශණ කමිටුව විසින්:

- පැමිණිල්ලේ හරය හඳුනාගැනීම
- සිදුවීම් අනුපිළිවෙල ඇතුළත් කාලරාමුවක් සකස් කිරීම
- කරුණු වල විවිධ අනුවාදයන් සංසන්දනය කිරීම
- ව්‍යවස්ථාදායක අණපනත්, ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සලකා බැලීමෙන් ලිංගික අතවරයක් හෝ අපයෝජනයක් සිදුවී ඇත්ද යන්න වැඩිබර සම්භාවිතාව මත තීරණය කිරීම

සිදු කළ යුතුය.

**(ඉ) අනාවරණය කරගැනීම් සහ නිර්දේශ**

පැමිණිල්ල සනාථකළ යුතුද නැද්ද යන්න විමර්ශන කමිටුව විසින් තීරණය කළ යුතුය. එම තිරණය මත පදනම්ව සුදුසු නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

- විමර්ශන කමිටුව පැමිණිල්ලට එරෙහිව තීරණය කළහොත්, පැමිණිලිකරුට කිසිදු සහනයක් නොලැබේ. කෙසේ වෙතත්, පැමිණිලිකරු විසින් චූදිත පාර්ශවයට එරෙහිව අසත්‍ය හෝ ද්වේශ සහගත චෝදනාවක් කළ බව ඔප්පු වුවහොත්, පැමිණිලිකරුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව පවතියි.

- චූදිත පාර්ශවය ලිංගික අතවරයකට වරදකරු බව විමිර්ශන කමිටුව විසින් තීරණය කළහොත්, ක්‍රියාත්මක විමේ ක්‍රමවේදය තුල දක්වා ඇති ඒවා ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී, වරදෙහි බරපතල ස්වභාවය අනුව දඬුවම් නිර්දේශ කිරීමට විමර්ශණ කමිටුවට අභිමතය ඇත.

- විමර්ශන කමිටුව විසින් එසේ අවශ්‍ය තත්ත්වයන් පවතින විට, මූල්‍ය හානි සහ/හෝ පහත දක්වා ඇති ආකාරයේ වෙනත් නීතිමය සහන සඳහා චූදිත පාර්ශවයට එරෙහිව වැඩිදුර නීතිමය පිළිසරණක් ලබා ගැනීමට පැමිණිලිකරු වෙත නිර්දේශ කළ හැකිය:
  - මානසික කම්පනය, ඇති වූ චිත්තවේගීය පීඩා
  - දැරීමට සිදු වූ වෛද්‍ය වියදම්
  - රැකියාව අහිමි වීම, ආදිය සහ/හෝ වෙනත් මූල්‍ය පාඩු

## 6. විමර්ශන කමිටුවේ සොයාගැනීම් වලට අදාළ ක්‍රියාමර්ග

පැමිණිල්ල ලැබුණු දින සිට දින 21ක් ඇතුළත, පැමිණිල්ල පිළිබඳ විස්තරය සහ අදාළ සියලු කරුණු සහ තත්වයන්, අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය, අදාළ නීති, උපයෝගී කරගනු ලබන ප්‍රතිපත්ති, සොයාගැනීම් සහ නිර්දේශ ඇතුළත් සවිස්තර වාර්තාවක් විමර්ශන කමිටුව විසින් සකස් කළ යුතුය.එම වාර්තාව ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපත් පැමිණිලිකරුට සහ චූදිත පාර්ශවයට ද ලබාදිය යුතුය. ඉන්පසු විමර්ශන කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. එවැනි ක්‍රියාමාර්ගයක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය හෝ සුදුසු යැයි ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් තීරණය කරනු ලබන විට, චූදිත පාර්ශ්වය නිරත වන ක්‍රීඩාවට අදාළ ජාතික ක්‍රීඩා සම්මේලනය හරහා එම ක්‍රියාමාර්ගය චූදිත පාර්ශ්වයට එරෙහිව යොමු කර පැනවිය හැකිය.

මෙම ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ ප්‍රතිපත්තිය අනුව ගනු ලබන සියලුම ක්‍රියාමාර්ග, ඕනෑම පැමිණිලිකරුවෙකුට සහ/හෝ අගතියට පත් පාර්ශ්වයකට නීතියෙන් ලබා ගත හැකි ඕනෑම අයිතිවාසිකම් සහ ප්‍රතිපාදනයකට අමතරව සහ අගතියකින් තොරව විය යුතුය.

## 7. රහස්‍යභාවය

ලිංගික අතවර සහ අපයෝජන පිළිබඳ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම අතිශයින් දුෂ්කර විය හැකි බවත්, ලිංගික අතවර සහ අපයෝජන සම්බන්ධයෙන් අසාධාරණ ලෙස වරදකරු වීම ව්‍යසනකාරී විය හැකි බවත් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් වටහාගෙන ඇත. කාරණය රහසිගතව තබාගැනීම සම්බන්ධයෙන් පැමිණිලිකරුගේ සහ චූදිත පාර්ශ්වයේ අවශ්‍යතාව ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් පිළිගනු ලැබේ. විනයානුකූල හෝ වෙනත් ප්‍රතිකර්ම

ක්‍රියාවලියකින් හෝ නීතියෙන් එවැනි හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන්නේ නම් මිස, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව සහ එහි නියෝජිතයන් විසින් පැමිණිලිකරුගේ නම, පැමිණිල්ලක් ඇතිවීමට හේතු වන තත්ත්වයන් හෝ චූදිත පාර්ශ්වයේ නම බාහිර පාර්ශවයන්ට හෙළි නොකළ යුතුය. විනය හෝ වෙනත් ප්‍රතිකර්ම ක්‍රියාවලියකින් හෙළිදරව් කිරීමට අවශ්‍ය හෝ නීතියෙන් හෙළි කිරීමට අවශ්‍ය වූ විට හැර රැස්වීම්වල අන්තර්ගතය, සම්මුඛ සාකච්ඡා, විමර්ශනවල ප්‍රතිඵල සහ අනෙකුත් අදාළ තොරතුරු ඇතුළු සියලුම පැමිණිලි වාර්තා ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් රහසිගතව තබා ගනු ලැබේ.

නිල වශයෙන් පැමිණිල්ලක් වාර්තා වන සෑම අවස්ථාවකදීම, සම්බන්ධ වූ සියලුම පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා ප්‍රවේශමෙන් සලකා බලමින් කඩිනම්, පරිපූර්ණ, සාධාරණ පරීක්ෂණයක් සිදු කරනු ලැබේ. විමර්ශනය අවසන් වූ පසු සියලුම ලේඛන මුද්‍රා තැබීම ඇතුළුව පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය හා සම්බන්ධ සම්මත ක්‍රියා පටිපාටි සෑම විටම අනුගමනය කරනු ලැබේ.

*ආරක්ෂිත ක්‍රීඩා ප්‍රතිපත්තියේ ඉංග්‍රීසි අනුවාදය, එහි* ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ *ආරක්ෂිත ක්‍රීඩා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමේ ක්‍රමවේදයේ සහ එහි පරිවර්තන අනුවාද අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, ඉංග්‍රීසි අනුවාදය බලපැවැත්විය යුතු ය.*